# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2221/55 - 2021 අප්‍රේල් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2021.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### මුදල් නීති පනත

(422 අධිකාරිය වූ) මුදල් නීති පනතේ 32ඉ වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් පනවන ලද රෙගුලාසි

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්,
සභාපති,
මුදල් මණ්ඩලය.

2021 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ දී ය.

**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි**

**2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි සඳහා සංශෝධන**

හැඳින්වීම

1 මෙම රෙගුලාසි 2021 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි ලෙස හැඳින්විය යුතු ය.

මූලික රෙගුලාසි සඳහා සංශෝධන

2 2010 සැප්තැම්බර් මස 28 දිනැති අංක 1673/11 දරන ***අති විශෙෂ*** *ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරන ලද 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ:-

(අ) එහි 9 වන රෙගුලාසිය, 9.4 ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් පහත පරිදි සංශෝධනය කෙරේ:-

''9.4 දක්වා ඇති සීමාවන්ට යටත්ව, අදාළ වන පරිදි බලපත්‍රය අත්හිටවූ හෝ අවලංගු කළ දින සිට කඩිනමින් වන්දි මුදල් ගෙවීමට කටයුතු කරනු ලබන අතර එම දිනයෙන් පසු කාලයට අදාළව කිසිදු පොලියක් ගෙවනු නොලැබේ''

(ආ) එහි 9 වන රෙගුලාසිය, 9.6 ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් පහත පරිදි සංශෝධනය කෙරේ:-

''9.6. තැන්පතුකරුවෙකුට ගෙවිය යුතු වන්දි මුදල ඉහත ලෙස ගණනය කරනු ලැබූ මුළු රක්ෂිත තැන්පතු ප්‍රමාණයට සීමා විය යුතු අතර එම මුදල් ප්‍රමාණය ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ එකොළහක (රු.1,100,000) මුදලක හෝ විදේශ මුදල් තැන්පතු සම්බන්ධයෙන් නම් සහ එය රුපියල් ලක්ෂ එකොළහ (රු.1,100,000) ඉක්මවන්නේ නම් ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ එකොළහක මුදල නොඉක්මවන උපරිමයකට යටත් විය යුතු ය.''




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) එහි 9 වන රෙගුලාසිය, 9.10 ඡේදයට පසු පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් සංශෝධනය කෙරේ:-

"9.11. බලපත්‍රය අවලංගු කරනු ලැබූ සාමාජික ආයතනයක් සම්බන්ධයෙන් වන විට, එම සාමාජික ආයතනය ඈවර කිරීම සම්බන්ධයෙන් නිසි අධිකරණයක් මගින් ඈවරකරුවෙකු පත් කිරීමට පෙර, නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන රක්ෂණාවරණ හිමි තැන්පතුකරුවන් පමණක් මෙම රෙගුලාසි යටතේ වන්දි මුදල් ලැබීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය."

අනුගත වීමේ වගන්ති

3 මෙම රෙගුලාසියේ බලාත්මක දිනයට පෙර අදාළ වන පරිදි බලපත්‍රය අවලංගු කළ හෝ අත්හිටවනු ලැබූ සාමාජික ආයතනයක රක්ෂණාවරණ හිමි තැන්පතුකරුවන් රුපියල් ලක්ෂ එකොළහක (රුපියල් 1,100,000) හෝ විදේශ මුදල් සම්බන්ධයෙන් වන විට ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ එකොළහකට (රුපියල් 1,100,000) සමාන මුදල් ප්‍රමාණයක උපරිමයකට යටත්ව වන්දි මුදල් ලබාගැනීමට සුදුසුකම් ලැබිය යුතු ය. කෙසේ වෙතත් එසේ වන්දි මුදල් ලබාගැනීම සඳහා අදාළ තැන්පතුකරුවන් ;

(අ) අදාළ දිනය වන විට වන්දි මුදල් සඳහා අයදුම් නොකළ අය හෝ

(ආ) වන්දි මුදල් අයදුම් කර ඇති නමුත් අදාළ දිනය වන විට කිසිදු වන්දි මුදලක් ලබා නොමැති අය හෝ

(ඇ) වන්දි මුදලක් ලබා ඇති නමුත් අදාළ දිනය වන විට මුදලින් රුපියල් ලක්ෂ එකොළහකට (රුපියල් 1,100,000) අඩුවෙන් වන්දි මුදල් ලබා ඇති අය විය යුතු ය.

04 - 536

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.